*Proceedings of the Sixth Academic Sessions, University of Ruhuna 2009*
*Vol. 6 pg s 326 - 334*

# ශ්‍රී ලාංකික කාන්තා අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ යාන්ත්‍රණයක් ලෙස ජාතික කාන්තා කමිටුවෙන් ඉටුවන කාර්යභාරය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්.

**එරන්දි ශමිලා විජේකෝන් කන්නන්ගර**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.
✉ *erandikannangara@gmail.com*

සාරාංශය
අයිතිවාසිකම්වල විශේෂ ලක්‍ෂණය වනුයේ පොදු බවයි. යම්කිසි අයිතිවාසිකමක් පොදු මනුෂ්‍යභාවයෙන් හටගන්නේ නම් එය මිනිස් අයිතිවාසිකමක් වේ. (ප්‍රනාන්දු, 1997 : 07). ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සියලු මානව අයිතීන්වල පදනම වශයෙන් සැලකේ. ලිංගභේදය පදනම් කොටගෙන ස්ත්‍රී පුරුෂ වශයෙන් බෙදීමක් පැවතුන ද එම දෙපාර්ශවයම මානව ජීවීහු වෙති. එනම් කාන්තාව ද මානව පවුලේ සාමාජිකාවක වන්නීය. පුරුෂයාට හා සමාන අයිතියක් මානව අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ඇයට ද හිමි වේ. එබැවින් කාන්තා අයිතීන් යනු විශේෂ හිමිකමක් නොවන අතර ඒවා මානව අයිතීන්ම වේ. එනිසා ස්ත්‍රී පුරුෂ භේදය අනුව වෙනස්කමකට ලක් නොවී සම අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවස්ථාව කාන්තාවට ද ලබා දීම වැදගත් වේ. කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ තත්ත්වය රටක සංවර්ධනය මැනීමේ දර්ශකයක් බවට ද අද පත්ව තිබෙ. කාන්තා අයිතීන් සුරැකීම සඳහා සම්මුති, ප්‍රඥප්ති හඳුන්වාදීම, නීතිමය පද්ධතිය ශක්තිමත් කිරීම හා නොයෙකුත් ආයතන ස්ථාපිත කිරීමට රජය කටයුතු කර ඇත. ශක්තිමත් නීතිමය පද්ධතියක් පැවතිය ද ක්‍රියාත්මකභාවය තුළ පවතින අඩුලුහුඩුකම්, සමහර ආයතනයන්හි ක්‍රියාකාරීත්වය තුළ පවතින අඩුලුහුඩුකම්, ආදී විවිධාකාරි දුර්වලතාවයන් නිසාද කාන්තා අයිතිවාසිකම් නිසිලෙස සුරක්ෂිත නොවේ. (සාවිත්‍රි ගුණසේකර මහත්මිය සමඟ පැවැත්වූ සාකච්ඡාවක් ඇසුරිනි) කෙසේ වුවත් ලාංකික කාන්තාව හිමිකර ගත් ජයග්‍රහණයන් රාශියකි කාන්තාවන්ගෙන් 90% ලිවීමේ, කියවීමේ හැකියාව ඇත. ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය 33%කි. ජාතික ආදායමෙන් 60% ක් ම දායකත්වය ලැබෙන්නේ කාන්තාවන්ගෙනි. (සුමනසේකර, එස්. 2007:3) නමුත් සමාජය තුළ කාන්තාවන්ට අසමාන ලෙස සැලකිල්ල දක්වන බව පැහැදිලිය. දිනපතා පළවන පුවත්පත්, වාරික වශයෙන් පළවන සඟරා ආදිය තුළ දක්නට ලැබෙන ඇයගේ අයිතීන් උල්ලංඝනය වීමට අදාළ සිදුවීම් හරහා මේ බව තහවුරු වෙයි. ලංකාවේ කාන්තාවන්ට එරෙහිව පවත්නා වෙනස්කම් තවදුරටත් පවතින බව සැලකිල්ලට ගනිමින් ඇයගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට කාන්තා ප්‍රඥප්තිය සකස් කොට එහි දක්වූ අයිතිවාසිකම් කාන්තාවට ලබාදීමට කටයුතු කිරීමේ අරමුණ ඇතිව "ජාතික කාන්තා කමිටුව" ස්ථාපිත කර තිබේ. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ කාන්තා කමිටුව විසින් කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා දක්වූ දායකත්වය පරීක්ෂා කිරීමයි. ඒ සඳහා කමිටුවේ සාමාජිකයන්ගෙන් අහඹු ලෙස තෝරාගත් 33% ක් වූ නියැදිය හා අදාළ කාලසීමාව තුළ කමිටුවෙන් සේවය ලබාගත් කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචි අයගෙන් අහඹු ලෙස තෝරාගත් 20% ක් වූ නියැදිය මඟින් ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා තුළින් අවශ්‍ය ප්‍රාථමික දත්ත ලබා ගත්තේය. ද්විතීයික දත්ත ද උපයෝගී කරගෙන ලබාගත් තොරතුරු විස්තරාත්මකව විශ්ලේෂණය කරමින් අරමුණ සාධානය කර ගැනීමට වගු, ප්‍රස්ථාර ආදිය යොදා ගෙන ප්‍රතිශතාත්මක ඇගයීමක් ද සිදු කළේය. කාන්තා ප්‍රඥප්තියේ සඳහන් අයිතිවාසකම් ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට ලබාදීමට කටයුතු කිරීමේදී ජාතික කාන්තා කමිටුව බොහෝ ගැටළුවලට මුහුණ දී සිටින බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. කමිටුව මඟින් සැපයූ සේවාව පිළිබඳ ජනතාවගේ තෘප්තිමත්භාවය අවම මට්ටමක පැවති බවත්, කාන්තා අයිතීන් සුරැකීමේ දී ජාතික කාන්තා කමිටුවේ දායකත්වය අවම මට්ටමක පවතින බවත් නිගමනය කළේය.

**මූලික පදයන් :** අයිතිවාසිකම්, මානව අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, කාන්තා අයිතිවාසිකම්

## හැඳින්වීම

හොබ් හවුස් ප්‍රකාශ කර ඇති පරිදි යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වන අනුන් අපෙනුත් අප අනුන්ගෙනුත් අපේක්ෂා කරන්නා වූ සමාජ ඉඩ ප්‍රස්ථාවන් අයිතිවාසිකම් වේ. අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැකිය හැකි විශේෂ ලක්‍ෂණය වන්නේ පොදු බවයි. ඒ අනුව මානව අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය පොදු මනුෂ්‍යභාවය පිළිබඳ මතය මත

ගොඩනගා ඇත. යම්කිසි අයිතිවාසිකමක් මිනිස් අයිතිවාසිකමක් වන්නේ එය පොදු මනුෂ්‍යභාවයෙන් හටගන්නේ නම් පමණි. එම නිසා මානව අයිතීන් සඳහා වන ඉල්ලීම් කිසියම් පිරිසකට පක්ෂග්‍රාහී, කිසිවෙකුට විරුද්ධව ඉදිරිපත් නොවිය යුතුය (ප්‍රනාන්දු, 1997: 07). ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සියලු මානව අයිතීන්වල පදනම වශයෙන් සැලකෙන අතර, වර්ගය, ලිංග භේදය, ජාතිය, ආගම, පංතිය හෝ එවැනි අනෙක් විෂමතාවලින් තොරව සෑම මනුෂ්‍යයෙකුට ම තිබිය යුතු යැයි විශ්වාස කරන අයිතිවාසිකම් වේ (අන්තර් ජාතික මානව අයිතිවාසිකම් පනත, 2003: 6, 7).

කාන්තාව ද මානව පවුලේ සාමාජිකාවක වන්නීය.ලිංගභේදය පදනම් කොටගෙන ස්ත්‍රී පුරුෂ වශයෙන් බෙදීමක් පැවතුන ද, එම දෙපාර්ශවයම මානව ජීවීහු වෙති. මොවුන්ගේ ජීවිතය යහපත් අයුරින් පවත්වා ගැනීමට ඉඩ සලසා දීම වැදගත් වෙයි. ඒ සඳහා අවශ්‍ය ප්‍රධානම කොන්දේසිය වශයෙන් අයිතිවාසිකම් හැඳින්වේ. නමුත් මෙහිදී විශේෂ අවධානය යොමුවිය යුතු කරුණ වන්නේ ස්ත්‍රී පුරුෂ භේදය අනුව වෙනස්කමකට ලක් නොවී සම අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවස්ථාව කාන්තාවට ද ලබා දීමයි.

ශ්‍රී ලාංකික කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා කටයුතු කරන ආයතනයක් ලෙස ජාතික කාන්තා කමිටුවේ දායකත්වය පිළිබඳ පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. කාන්තා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ජාතික කාන්තා කමිටුව මඟින් ඒ සඳහා දායකත්වයක් ලැබේද යන්න මෙමගින් සොයා බලයි. මෙහිදී කාන්තා කමිටුවෙන් ඉටුවන කාර්යභාරය පිළිබඳව විශ්ලේෂණාත්මක ඇගයීමක් සිදු කරනු ඇත.

ඒ සඳහා ප්‍රාථමික හා ද්විතීයික දත්ත භාවිතා කර තොරතුරු රැස් කරන ලදී. 2000 වසරේ ජූනි මාසයේ සිට 2007 ජූනි මාසය දක්වා වසර 07 ක පමණ කාලයේ ජාතික කාන්තා කමිටුව විසින් කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කරන ලද දායකත්වය විශ්ලේෂණය කළේය. අධ්‍යයනයට අයත් කාලය තුළ කටයුතු කළ කමිටු තුනේ ම (එක් කමිටුවක සාමාජිකයන් 15 දෙනා බැගින් වූ) සාමාජිකයෝ 45 දෙනෙකු වූ ප්‍රමාණය ඒ සඳහා සංගහනය ලෙස ගත්තේ ය. එක් කමිටුවක සාමාජිකයන් 05 දෙනා බැගින් නියෝජනය වන ලෙස කමිටු 03 න් ම අහඹු ලෙස සාමාජිකයෝ 15 දෙනෙකු ගෙන් යුත් නියැදියක් තෝරා ගන්නා ලදී. එම නියැදි ප්‍රමාණය සංගහනයෙන් 33%ක් පමණ වේ. ඔවුන් සමග සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි අදාල කරගෙන ආයතනික මට්ටමින් තොරතුරු ලබා ගන්නා ලදී.

එමෙන්ම කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා පවතින ආයතනයක් ලෙස ජාතික කාන්තා කමිටුවේ වැදගත්කම පිළිබඳව ජනතාවගේ දෘෂ්ටියෙන් විමසා බලන ලදී. 2006 වසරේ ජූනි මාසයේ සිට 2007 ජූනි මාසය දක්වා එම ආයතනයට තම ප්‍රශ්න යොමු කළ කොළඹ දිස්ත්‍රික්කයට අයත් කාන්තාවන් 250 ක් වූ ප්‍රමාණය මේ සඳහා අදාල සංගහනය වේ. එම සංගහනයෙන් 50 දෙනෙක් අහඹු නියැදිය ලෙස තෝරා ගන්නා ලදි. එම නියැදි ප්‍රමාණය සංගහනයෙන් 20% ක් පමණ වේ.

නියැදියේ වයස් පරතරය අවු 18 - 38 ක් විය. සාමාන්‍ය පෙළ, උසස් පෙළ හා විශ්වවිද්‍යාල දක්වා අධ්‍යාපනය ලැබූ අයගෙන් නියැදිය සමන්විත අතර, රැකියාවල නියුක්ත මෙන්ම රැකියාවල වියුක්ත පිරිසගෙන් මෙම නියැදිය සැකසී ඇත. විවාහක මෙන්ම අවිවාහක කාන්තාවන් ද නියැදියට අයත් වේ. ඔවුන් සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමෙන් හා සම්මුඛ සාකච්ඡා මගින් ජාතික කාන්තා කමිටුව පිළිබඳ ජනතාවගේ ආකල්පය පිළිබඳ තොරතුරු ලබා ගත්තේය.

ඉහත දැක්වූ ප්‍රාථමික දත්ත මෙන් ම මෙම අධ්‍යයනය සඳහා ද්විතීයික දත්ත ද අදාල කර ගත්තේ ය. පොත්පත්, ලිපි, සඟරා, පුවත්පත්, වනිතා කටයුතු අමාත්‍යාංශය, ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය හා ජාතික කාන්තා කමිටුව මගින් ප්‍රකාශයට පත් කරන ලද සඟරා, වාර්ෂික වාර්තා හා සැලසුම් යනාදිය ද මූලාශ්‍ර වශයෙන් යොදා ගෙන තොරතුරු ලබා ගන්නා ලදි.

මෙසේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර මගින් ලබා ගන්නා ලද තොරතුරු විස්තරාත්මකව විශ්ලේෂණයට ලක් කළේය. ඒ සඳහා වගු, ප්‍රස්ථාර ආදිය යොදා ගනිමින් ප්‍රතිශතාත්මක ඇගයීමක් සිදු කරන ලදි.

ස්ත්‍රීන්ට එරෙහි සියලු ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය (The Convention on the Elimination of Discrimination Against Women) - සිඩෝ - කාන්තා අයිතීන් සහතික කිරීම උදෙසා ඉතා වැදගත් වූවකි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ස්ථාපිත කළ කාන්තාවන්ගේ අයිතීන් පිළිබඳ කොමිෂමේ අප්‍රතිහත ධෛර්‍යයේ ප්‍රතිඵලයක් ලෙස 1979 දෙසැම්බර් 18 වන දා සිඩෝ ප්‍රඥප්තිය බිහි විය.

ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව පුරුෂයන් හා සමානත්වයෙන් යුතුව සියලු අයිතිවාසිකම් භුක්ති විඳීමට කාන්තාවට ද ඉඩ ප්‍රස්ථා හිමි විය යුතු බව සිඩෝ සම්මුතිය මඟින් අවධාරණය කරයි. මෙම ප්‍රඥප්තිය නිසා අවසානයේ කාන්තා අයිතිවාසිකම් යනු මානව අයිතිවාසිකම්ය යන අදහසට ද අන්තර්ජාතික අවධානය යොමුවීම සිදු වූ අතර, 1993 පැවැත්වූ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ දී ස්ත්‍රී අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් ලෙස එක් වැදගත් ප්‍රකාශනයක් මඟින් පිළිගන්නා ලදී. (Agoson, 2003: 52).

කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ මෙම ජාත්‍යන්තර පිබිදීම ලංකාව තුළ ද නිර්මාණය වෙමින් පැවතුණි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ වූ 12(2) වගන්තිය මඟින් ලිංගිකත්වය හා වෙනත් කරුණු මත වෙනස් කොට නොසැලකමේ මූලධර්මය පැහැදිලිව දක්වා ඇත. එහි 12(4) වගන්තිය ද කාන්තා අයිතිවාසිකකම් සම්බන්ධයෙන් මැදිහත් වූ අවස්ථාවන් ය. කාන්තා කර්යාංශයක් සහ වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යංශයක් ස්ථාපිත කිරීමට ද මෙම ව්‍යවස්ථාව යටතේ කටයුතු යෙදිණි. 1981 දී ශ්‍රී ලංකාව ද 'සිඩෝ ප්‍රඥප්තිය' අනුමත කළේය. එකී ප්‍රඥප්තිය ගුරු කොට ගනිමින් 1993 වර්ෂයේ දී 'කාන්තා ප්‍රඥප්තිය' කැබිනට් මණ්ඩලය තුළ අනුමත වීම සිදු විය. 1990 මුල් භාගයේදී ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන් සඳහා වන වෙනමම ඒකකයක් පොලිස් මූලස්ථානයේදී පිහිට වූ අතර පසුව දිවයිනේ ප්‍රධාන පෙළේ ස්ථාන 31 ක මෙම ඒකක පිහිටුවනු ලැබීය (සැමුවෙල්, 1999: 5 ). කාන්තාවන් මුහුණ දෙන අතවර සම්බන්ධයෙන් කටයුතු කිරීමට 'දිරිපියස' වැනි ආයතන ද රජය මඟින් ස්ථාපිත කර ඇත.

කාන්තා අයිතීන් සුරැකීම සඳහා වන මෙරට නීතිමය රාමුව පිළිබඳව විමසා බැලීමේදී අපරාධ නීතිය තුළ ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීමට විධිවිධාන යොදා ඇතත් ක්‍රියාත්මකභාවය තුළ පවතින අඩුලුහුඩුකම් රැසක් හේතුවෙන් කාන්තා අයිතීන් මෙරට තුළ නිසිලෙස සුරක්ෂිත වී නැත. ස්ත්‍රී දූෂණවල නව ප්‍රවණතාවක් වන්නේ කාන්තාවන් විවාහ කරගන්නා බව අඟවමින් ඔවුන් සමඟ ලිංගික සංසර්ගයේ යෙදීමයි. එසේ රැවටීමට හසු වී ගැබ් ගැනීමට ලක්වන කාන්තාවන් ප්‍රතික්ෂේප කිරීම එම පුරුෂයින් විසින් සිදු කරයි. එවැනි අවස්ථාවක තම දරුවාගේ පියා ඔහු බව සනාථ කිරීමට ඇයට සිදු වෙයි. ඒ සඳහා DNA පරීක්ෂණයක් සිදු කළ යුතුය. එය පීතෘත්වය සනාථ කිරීමට යොදාගන්නා පිළිගත් ක්‍රමවේදය වුවද, DNA පරීක්ෂණයට පෙනී සිටීම ප්‍රතික්ෂේප කිරීමට එම පුරුෂයාට හැකියාව ඇත. එසේ පෙනී සිටීම ප්‍රතික්ෂේප කරන පුරුෂයෙකුට ඒ සඳහා බලපෑම් කිරීමට ප්‍රමාණවත් වන ආකාරයට නීතිය සවිබලකරණය වී නැත. කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීම සම්බන්ධව පවතින නීතිය තුළ පවතින හිඩැසක් ලෙස මෙය දැක්විය හැකිය (සාවිත්‍රී ගුණසේකර මහත්මිය සමඟ කළ සාකච්ඡාවක් ඇසුරිනි. 2007.05.11).

එමෙන්ම විවාහ හා දික්කසාද නීති, දේපළ හා වෙනත් උරුමයන් ලබා ගැනීම පිළිබඳ නීති ද, මෑතකදී සම්මත කරනු ලැබූ 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත ද, 1956 අංක 47 දරණ ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත, 1939 අංක 32 දරණ ප්‍රසූතිකාගාර ආඥා පනත, 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත යනාදී කාන්තාව සුරකින කම්කරු නීති මගින් ද කාන්තා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා වූ යාන්ත්‍රණය ශක්තිමත් කරයි. නමුත් නිදහස් වෙළඳ කලාප සේවිකාවන් සම්බන්ධයෙන් සාමාන්‍ය කම්කරු නීති අදාළ නොවේ. එසේම ආයෝජන පනතේ කම්කරු අයිතිවාසිකම් සඳහන් කොට නැත. රාත්‍රී සේවය, අධික පැය ගණනක් සේවය කිරීමට සිදුවීම වැනි තත්ත්වයන් හරහා මෙම ස්ථානවල සේවයේ යෙදෙන කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් නිරන්තරයෙන් සිදු වේ (කාන්තා කම්වු සාමාජික ජී. පතිරණගේ මහතා සමඟ කළ සාකච්ඡාවක් ඇසුරිනි). මේ අනුව පෙනී යන්නේ කාන්තා අයිතිය සුරක්ෂිත කිරීම සඳහා ශක්තිමත් නීති පද්ධතියක් පැවතියද ක්‍රියාත්මක භාවයේදී පවතින දූර්වලතා හේතුවෙන් නීතිය නිසි ලෙස ක්‍රියාවේ නොයෙදෙන බවය.

එසේ වුවත් ශ්‍රී ලාංකික කාන්තාව ලබාගත් ජයග්‍රහණයන් රාශියකි. 2004 වර්ෂයේ ලෝකයේ කානතාවන්ගේ ජීවන තත්ත්ව දර්ශක අනුව ශ්‍රී ලාංකික කාන්තාවගේ ජීවන තත්ත්ව දර්ශකය 73%කි. එය සංවර්ධිත රටවල දර්ශකවලට සමානය. ශ්‍රී ලංකා කාන්තාවන්ගෙන් 90%කට ම ලිවීමේ, කියවීමේ හැකියාව ඇත. විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනයේ නියුතු අයගෙන් 52%ක් ම කාන්තා පක්ෂයේ ය. ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය 33%කි. ජාතික ආදායමෙන් 60%කට ම දායකත්වය ලැබෙන්නේ කාන්තාවන්ගෙනි.

රජයේ හා පුද්ගලික අංශයේ රැකියාවල සිටින්නන්ගෙන් 1/3ක් ම කාන්තාවන් ය. කාන්තාවන්ගේ ආයු කාලය අවුරුදු 75.4 කි (සුමනසේකර එස්. 2007.03). එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නවතම සමීක්ෂණයකට අනුව 30% ක් පමණ රටවල කාන්තාව පවුලේ ආදායම මෙන් හරි අඩක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් උපයන බව වාර්තා වෙයි. වසර 2010 වනවිට කාර්මික රටවල ආදායමෙන් කාන්තාව උපයන ප්‍රමාණය දැනට පවතින 73% ප්‍රමාණය 81% දක්වා වැඩි වීමට හැකි බව ලෝක කම්කරු සංවිධානය පෙන්වා දෙයි. කාන්තාව මෙසේ සමාජ සංවර්ධනයට දායක වන අතරම ඇය ගෘහස්ථ කාර්යයන් සඳහා කැපවීම ද අනිවාර්ය වී තිබේ. ගෘහණියකගේ ශ්‍රම පැය ගණන අනුව වර්ෂයකට ඇයට ගෙවිය යුතු මුදල ඩොලර් 14,500ක් පමණ බව ඇමරිකාව වාර්තා කරයි. පෙරදිග කාන්තාව බටහිර කාන්තාවට වඩා පවුල් ඒකකයට ලැදි බැවින් ඇගේ කැපවීම මීට වඩා වෙනස් විය හැකි බව සමාජ විද්‍යාඥයෝ කියා සිටිති (පතිරණ, 2005: 52).

නමුත් සෑම සමාජයකම පාහේ කාන්තාවට අසමාන ලෙස සැලකිල්ලක් දක්වන බව පැහැදිලි ය. 2000 - 2005 වසර තුළ පොලීසියට වාර්තා වූ කාන්තාවන්ට එරෙහිව සිදු වූ හිංසනයන් පිළිබඳ පොලිස් දත්ත සමහරක් පහතින් දැක්වේ.

2000 - 2005 වසර තුළ පොලීසියට වාර්තා වූ කාන්තාවන්ට එරෙහි හිංසනයන්

| හිංසන වර්ගය | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| සුළු අපරාධ | | | | | | | |
| ලිංගික අතවර | 629 | 719 | 708 | 1006 | 743 | 1,037 | 4,842 |
| සුළු තුවාල කිරීම් | 1,019 | 1,629 | 1,883 | 690 | 3,788 | 2,210 | 11,219 |
| ගබ්සා කිරීම් | 14 | 25 | 0 | 5 | 44 | 30 | 118 |
| මරණීය තර්ජන | 277 | 408 | 231 | 3 | - | - | 919 |
| බරපතල අපරාධ | | | | | | | |
| මිනීමැරුම් | 159 | 134 | 144 | 139 | 136 | 123 | 835 |
| මිනීමැරීමට තැත් කිරීම් | 31 | 51 | 31 | 16 | 24 | 27 | 180 |
| දූෂණ | 320 | 395 | 333 | 409 | 362 | 460 | 2,279 |
| ලිංගික අපයෝජන, අස්වාභාවික ලිංගික හැසිරීම් | 17 | 46 | 40 | 197 | 44 | 28 | 372 |
| බරපතල තුවාල සිදු කිරීම් | 729 | 658 | 597 | 598 | 727 | 640 | 3,949 |
| කුට්ටනය සහ පැහැරගෙන යාම් | 53 | 96 | 101 | 128 | 111 | 118 | 607 |
| ව්‍යභිචාර සිද්ධීන් | 1 | 5 | 7 | 6 | 11 | 16 | 46 |

(සුවදැරිකා සවිය පුවත් සඟරාව, 2006: 06).

රටේ තවත් පුරවැසියකු වශයෙන් කාන්තාවට ද එම රටේ පුද්ගලයන්ට ලැබිය යුතු සියලු අයිතිවාසිකම් හා වරප්‍රසාද භුක්ති විඳීමේ හැකියාව නොලබන බව මෙයින් පැහැදිලි වෙයි. නමුත් ලිංග භේදය පදනම් කොට ස්ත්‍රියකට අයිතිවාසිකම් භුක්ති විඳීමට අවස්ථාව සලසා නොදීම සම්බන්ධව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය. මන්ද කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ තත්ත්වය රටක සංවර්ධනය මැනීමේ දර්ශකයක් බවට ද අද පත්ව ඇත. රටක සංවර්ධනය කරා යන ගමනේ දී එයට අවශ්‍ය සැලසුම් ද පැවතිය යුතුයි. 2000 වසරේ එක්සත් ජාතීන්ගේ මානව සංවර්ධන වාර්තාව පෙන්වා දෙන්නේ කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීමේ සැලසුම් කෙරෙහි එහි දී අවධානය යොමු කළ යුතු බවයි.

කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කාන්තා ප්‍රඥප්තියේ 17 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති ජාතික කාන්තා කමිටුව ප්‍රඥප්තියෙන් හඳුන්වා දී ඇති ප්‍රමිතීන් වටහා ගෙන රජයේ පරමාර්ථ ඉෂ්ට කිරීම සඳහා ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය තුළ කටයුතු කරයි. කාන්තා අභිවෘද්ධි හා ළමා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙකී කමිටුව

පූර්ණකාලීන විධායක අධ්‍යක්ෂිකාව ඇතුළු නීතිය, සෞඛ්‍යය, ආර්ථික සංවර්ධනය, අධ්‍යාපනය, විද්‍යාව හා තාක්ෂණය, පරිසරය, කාන්තාවන්ගේ ස්වේච්ඡා සංවිධානවල හෝ කාන්තා කටයුතු ක්ෂේත්‍රයන්හි දෙදෙනෙකු බැගින් එකී අංශ 07 සඳහා පත් කළ සාමාජිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත වේ. මොවුන් අතරින් දෙදෙනෙකු ජනාධිපතිතුමා විසින් සභාපති හා ලේකම් තනතුරට පත් කරනු ලැබේ. සභාපති හා කමිටුවේ අනෙකුත් සාමාජිකයින් වසර 04 ක කාලයක් සඳහා ධූරය දැරිය යුතුය. මාස 02 කට වරක් හෝ අවශ්‍යතා අනුව හැකිතාක් නිරතුරුවම කමිටුව රැස් විය යුතුය (මූලාශ්‍රය : වනිතා කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව; 2003).

1999 දී කාන්තා කමිටුව යටතේ කාන්තා පැමිණිලි මධ්‍යස්ථානයක් පිහිටවනු ලැබීය. එහි සේවය සඳහා නීති නිළධාරීන් දෙදෙනෙකු ඇතුළු කාර්ය මණ්ඩලයක් පවතී.

ජාතික කාන්තා කමිටුවේ කාර්යභාරය

01. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදු කරන වෙනස්කම් පිළිබඳ ව පැමිණිලි භාර ගැනීම, ඒවා සන්නිරීක්ෂණය කොට අවශ්‍ය සහනයක් සඳහා අදාල රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට යොමු කිරීම හා එම ක්‍රියාමාර්ග සමීක්ෂණය කිරීම.
02. මේ ප්‍රඥප්තියේ අන්තර්ගත ව ඇති පරිදි, කාන්තා අයිතිවාසිකම් හා වගකීම් විෂයෙහි නෛතික හා සංවර්ධන ප්‍රතිපත්තිවලින් ඇතිවන බලපෑම ඇගයීම.
03. අදාල පර්යේෂණ දිරිගැන්වීම තුළින් ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට උපකාරී වීම සහ ඒ පර්යේෂණ පදනම් කරගත් ප්‍රතිසංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
04. කාන්තා ප්‍රඥප්තියේ සඳහන් කාන්තා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම.
05. කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ ව විෂය භාර ඇමතිනිය විසින් කමිටුවේ අවධානයට යොමු කෙරෙන කරුණු පිළිබඳ ව හෝ උචිත යැයි කමිටුව සිතන කටයුතු කිරීමට හෝ ඇමතිනිය වෙත උපදෙස් දීම. (මූලාශ්‍රය : වනිතා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රගතිය හා සැලසුම්, 2000

කමිටුව යටතේ පවත්වා ගෙන යන පැමිණිලි මධ්‍යස්ථානයට කාන්තාවන් මුහුණ දෙන විවිධාකාරයේ ගැටලු යොමුකර ඇති බව පැහැදිලි වෙයි. කාන්තාවන් වැඩි ප්‍රමාණයක් මුහුණ දුන් ගැටලුව වූයේ ගෘහස්ථ හිංසනය වන අතර, එය ප්‍රතිශතයක් ලෙස 20% කි. ස්ත්‍රී දූෂණය සම්බන්ධ පැමිණිලි 10%, පහරදීම් සම්බන්ධ පැමිණිලි 8%, පැහැරගෙන යාම් හා අතුරුදහන්වීම් 6%, ලිංගික අතවර සම්බන්ධ පැමිණිලි 6% ආදි වූ හිංසන ක්‍රියා සම්බන්ධ පැමිණිලිවල මුළු ප්‍රතිශතය 50% කි. ඉදිරිපත් කළ ගැටලුවලින් වැඩි ප්‍රතිශතය මෙන්ම මුළු ගැටලු ප්‍රමාණයෙන් 50% ක්ම හිංසනය සම්බන්ධ ගැටලු බව අනාවරණය වේ. දෙවනුව වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ නඩත්තු සම්බන්ධව ය. එය 14% කි. ස්වාමිපුරුෂයා අත් හැර ගිය බොහෝ කාන්තාවන් නඩත්තු ලබා ගැනීමට නඩු පැවරීමට ඉදිරිපත් වී ඇති බව තහවුරු විය. තුන්වන ස්ථානයට ගැණෙන පැමිණිලි ඉඩම් ආරවුල් වන අතර, එය 12% කි. බොහෝ විට ඉඩම්වල සන්තකයෙන් බලෙන් ඉවත් කරන ලද කාන්තාවන් මධ්‍යස්ථානයට පැමිණිලි ඉදිරිපත් කර ඇති බව අනාවරණය විය. කාන්තාවන් විසින් ඉදිරිපත් කරන ලද රැකියා හා උසස්වීම් සම්බන්ධ ගැටලු ප්‍රමාණය 6% කි. රැකියාවලින් ඉවත් කිරීම් හා උසස්වීම් ලබා නොදීම යනාදිය මෙයට ඇතුළත් විය.ගැටලුවල ස්වභාවය පිළිබඳ අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැකි වූයේ වයස් සීමාවක්, අධ්‍යාපන මට්ටම, විවාහක අවිවාහක බව කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමේදී සුවිශේෂී ව බලපා නොමැති බවයි. ස්ත්‍රී දූෂණයට ලක්වූ අය පමණක් අවු: 18ත් 19ත් අතර වයසේ පසුවූ අවිවාහක අයවූහ. පැහැරගෙන ගිය හා අතුරුදහන් වූ අය, රැකියාවක් ලබාගැනීම සඳහා යොමු වූ පිරිස ද අවිවාහක අය වූහ. විශ්ව විද්‍යාලය දක්වා අධ්‍යාපනය ලැබූ කාන්තාවන් තුල පවා කාන්තා අයිතිවාසිකම් හා නීතිමය දැනුවත්භාවය අවම මට්ටමක පවතින බැවින් අයිතීන් උල්ලංඝනය වී ඇති අයුරු ද දැකගත හැකි විය.

කම්ටුවේ පැමිණිලි මධ්‍යස්ථානයට යොමු කළ ගැටලුවල ස්වභාවය

| ගැටලුවේ ස්වභාවය | ප්‍රමාණය | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ගෘහස්ථ හිංසනය | 10 | 20 |
| නඩත්තු | 7 | 14 |
| ඉඩම් ආරවුල් | 6 | 12 |
| ස්ත්‍රී දූෂණ | 5 | 10 |
| දික්කසාද | 4 | 8 |
| පහරදීම් | 4 | 8 |
| සේවා නියුක්තිය හා උසස් වීම් | 3 | 6 |
| රැකියාවක් ලබා ගැනීම | 3 | 6 |
| පැහැරගෙන යාම් හා අතුරුදහන් වීම් | 3 | 6 |
| ලිංගික අතවර | 3 | 6 |
| පවුල් ආරවුල් | 2 | 4 |
| එකතුව | 50 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය 2007

ගැටලු විසඳීමට ගත් ක්‍රියාමාර්ගයන්

| ගැටලුව | සමථ කිරීම | වෙනත් ආයතනයක් වෙත යොමු කිරීම | නීති උපදෙස් ලබාදීම |
|---|---|---|---|
| ගෘහස්ථ හිංසනය | | 05 | 05 |
| නඩත්තු | | 06 | 01 |
| ඉඩම් ආරවුල් | | | 06 |
| ස්ත්‍රී දූෂණ | | 04 | 01 |
| දික්කසාද | | | 04 |
| පහරදීම් | | | 04 |
| සේවා නියුක්තිය හා උසස් වීම | | | 03 |
| රැකියාවක් ලබා ගැනීම | | 03 | |
| පැහැරගෙන යෑම් හා අතුරුදහන් වීම් | | | 03 |
| ලිංගික අතවර | | 03 | |
| පවුල් ආරවුල් | 02 | | |
| එකතුව | 02 | 21 | 27 |
| ප්‍රතිශතය % | 0 | 42 | 54 |

(සමීක්ෂණ තොරතුරු, 2007)

නියැදි සමීක්ෂණයෙන් හඳුනාගත හැකි තත්ත්වය වූයේ පැමිණිලි මධ්‍යස්ථානයට යොමු කළ ගැටලු වෙනුවෙන් නීති උපදෙස් ලබාදීම, ගැටලු සමථයකට පත් කිරීම හා වෙනත් ආයතනයක් වෙත සහන ලබා ගැනීම සඳහා ඔවුන්ව යොමු කළ බවයි. නියැදි සමීක්ෂණයට අනුව එසේ යොමු කළ ප්‍රමාණය 42% කි. නීති ආධාර ලබාදීම, උපදේශනය ලබාදීම හා එම ගැටලු විමර්ශණය කොට ඒවා සමථයකට පත් කිරීමේ හැකියාව ආයතනයට නොමැති නිසා එහි සේවය ලබා ගන්නන් දුෂ්කරතාවන්ට ලක් වී ඇති බව අනාවරණය විය. වෙනත් ආයතනයක් වෙත යොමු කළ ද එම ආයතන ද තමන්ට ප්‍රමාණවත් ප්‍රතිචාර නොලැබුණු බවත්, ඒනිසා

නැවත කමිටුවට පැමිණීමට සිදු වූ බවත් අනාවරණය විය. සමහර ආයතන විසින් ඔවුන්ගේ ගැටලු නොසලකා හරින ලද නමුත් ගැටලුව සලකා බලා ක්‍රියාමාර්ග ගත් බවට ජාතික කාන්තා කමිටුවට තොරතුරු ලබා දී ඇත.


ආයතනයේ සාමාජිකයින් සමඟ සාකච්ඡා කිරීමේදී අනාවරණය වූ කරුණ නම් කමිටුව විසින් වෙනත් ආයතනයන් වෙත යොමු කරනු ලබන ගැටලුවලට යහපත් ප්‍රතිචාර නොලැබෙන ආයතනවලින් සිහි කැඳවීම් යවා ප්‍රතිචාර ලබා ගැනීමට පැමිණිලි මධ්‍යස්ථානය කටයුතු කරන බවයි. නමුත් සමහර අවස්ථාවලදී රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට යොමු කරන ලද ගැටලු සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව වැරදි තොරතුරු ද කමිටුවට ඉදිරිපත් කර ඇති බව හෙළි විය. මේ නිසා ගැටලු යොමු කළ අය සම්බන්ධව මෙන් ම එම ගැටලු යොමු කළ ආයතන ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව ද පසු විපරම් කටයුතු සිදු කිරීමේ වැදගත්කම මේ අධ්‍යයනය තුළින් හෙළි විය.

මේ අනුව ජනතාව කමිටුවෙන් ලබාගත් සේවය පිළිබඳව තෘප්තිමත් වීම 36% ප්‍රතිශතයක් විය. ලබාගත් සේවය පිළිබඳ තෘප්තිමත් නොවූ පිරිස 64% කි. කොළඹ පමණක් මෙම ආයතනය පිහිටා තිබීම නිසා නැවත නැවත එම ආයතනයට යාම අපහසු වීම, ලිපි හා දුරකථන මගින් තම ගැටලු යොමු කළ ද එයට කමිටුව දැක්වූ ප්‍රතිචාරය යහපත් නොවීම, ගැටලු යොමු කිරීමට බොහෝ දෙනෙකු පැමිණිය ද ඔවුන්ගේ ගැටලු ඉදිරිපත් කිරීම සඳහා ආයතනය තුළ එක් නීති නිලධාරියෙකු පමණක් සිටීම නිසා බොහෝ වේලාවක් ආයතනය තුළ රැඳී සිටීමට සිදුවීමෙන් අපහසුතාවයට පත් වීම වැනි හේතූන් නිසා කමිටුවෙන් ලද සේවය පිළිබඳව ඔවුන් තෘප්තිමත් වී නැත.

එමෙන්ම කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීමට ක්‍රියාත්මක වන ආයතනයක් බැවින් ජනතාවට කමිටුව පිළිබඳ අවබෝධයක් තිබීම වැදගත් වේ. ඒ යම් කරුණක් සම්බන්ධව දැනුවත් කිරීමට මාධ්‍යයන් කිහිපයක් භාවිතා කළ හැක. නමුත් කමිටුව පිළිබඳව ජනතාවට අදහසක් ලබා දීමට එම මාධ්‍යයන් අතරින් ඉතා සීමිත සංඛ්‍යාවක් පමණක් භාවිතා කර තිබුණි. ඒවා ද ක්‍රමවත් ලෙස යොදා ගන්නා බවක් ද ජාතික හෝ ප්‍රාදේශීය මට්ටමින් ඒ සඳහා වැඩ පිළිවෙලක් ද ආයතනය තුළ දක්නට නොමැත.

කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත්භාවය ලබා දීමට කටයුතු කිරීමේදී වැඩමුළු පැවැත්වීම, මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම, කාන්තා දින විශේෂ වැඩසටහන් පැවැත්වීම ඔස්සේ එයට දායක වී ඇත.

**එක් එක් වර්ෂයේ පැවැත්වූ සමස්ත වැඩමුළු**




මූලාශ්‍රය : (නියැදි සමීක්ෂණය 2007)

නමුත් වර්තමානය වන විට ක්‍රමයෙන් වැඩමුළු පැවැත්වීම අඩු අගයක් ගෙන ඇත. සේවක හිඟය අමාත්‍යාංශය හරහා ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබා නොදීමත් බාධා වශයෙන් පවතී. ස්ත්‍රී පුරුෂ

සමාජභාවය පිළිබඳව ද කාන්තා ප්‍රඥප්තියේ ඇතුළත් කරුණු සම්බන්ධව ද පමණක් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලෙස ද, කාන්තා හිංසනය හා කාන්තා අයිතිවාසිකම් හා නීතිමය දැනුවත්භාවය පිළිබඳ යම් සීමිත වැඩමුළු ප්‍රමාණයක් පවත්වන ලෙස ද අමාත්‍යාංශ ප්‍රධානීන් විසින් උපදෙස් දී ඇත. කාන්තාව කෙරෙහි සමාජය තුළ පවත්නා ගතානුගතික ආකල්ප වෙනස් කිරීමත්, සියලුම ජනමාධ්‍යවල කාන්තාව පිළිබඳ නිශේධනාත්මක ආකල්ප නිරූපනය වැළැක්වීම සඳහා වන ප්‍රඥප්තියේ අරමුණු පෙරදැරි කරගනිමින් මාධ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වා තිබුණ ද නියැදි සමීක්ෂණයෙන් හඳුනාගත් පරිදි ඒ සම්බන්ධව කමිටු සාමාජිකයින් සෑහීමකට පත් නොවී තිබීම ඉහළ අගයක් ගනී.

මාධ්‍ය වැඩමුළු පැවැත්වීම පිළිබඳ අදහස

| විස්තරය | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| සෑහීමකට පත් විය හැක | 3 | 20 |
| සෑහීමකට පත් විය නොහැක | 12 | 80 |
| එකතුව | 15 | 100 |

මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය 2007

කාන්තාවන් හා එම විෂයට සංවේදී ක්ෂේත්‍රයන් පිළිබඳව මතු ව ඇති ගැටලු හඳුනා ගැනීම, ඒවා විසඳීම සඳහා උපාය මාර්ග හා ප්‍රතිපත්ති යෝජනා කිරීමේ අරමුණින් පර්යේෂණ සිදු කළ ද එම ගැටලු විසඳීම සඳහා පිළියම් සෙවීමේදී පර්යේෂණයන් තුළින් ලබාගත් තොරතුරු දායක කරගෙන ඇත්තේ ඉතා සීමිත ලෙසය.

කාන්තා ප්‍රඥප්තියේ සඳහන් අයිතිවාසිකම් හා ගැටෙන නීති හඳුනාගෙන, ඒවා සංශෝධනය කිරීමට අවශ්‍ය යෝජනා සකස් කිරීම සිදු කිරීමේදී මෙන්ම අදාල ආයතනවලට එම යෝජනා ඉදිරිපත් කර නීති සංශෝධනයට පෙළඹවීමේදී ද කමිටුවට ගැටලුවලට මුහුණපෑමට සිදු වූ බව අධ්‍යයනය මගින් අනාවරණය විය.

මේ ආකාරයට දත්ත විශ්ලේෂණය කිරීමේදී කාන්තා කමිටුවට යොමු කළ ගැටලුවල ස්වභාවය පිළිබඳ පරීක්ෂා කිරීමේදී නිගමනය කළ හැක්කේ, කාන්තා ප්‍රඥප්තියේ සඳහන් වන ස්ත්‍රී පුරුෂ භේදයෙන් ඇතිවන සැහැසි ක්‍රියාවලින් ආරක්ෂා වීමේ අයිතිය, රැකියාවේ සුරක්ෂිතභාවය හා උසස් කිරීම් යනාදිය සම්බන්ධයෙන් සම අයිතිය හා සම අවස්ථා, දේපළ අයිතිය සම්බන්ධ සම අයිතිය ස්ත්‍රී පුරුෂ භේදය පදනම් කරගත් [illegible] බවයි.

උපදේශනය [illegible] ද, නීති ආධාර [illegible] අවස්ථා ද, ගැටලු විමර්ශනය කොට ඒවා සමථයකට පත් කිරීමේ හැකියාව ද නොමැති නිසා එහි සේවය ලබා ගන්නන් දුෂ්කරතාවයන්ට මුහුණ දී තිබුණි. එමෙන්ම වෙනත් ආයතන වෙත යොමු කළ ගැටලුවලට එම ආයතන වෙතින් දැක්වූ ප්‍රතිචාර කමිටුවේ කටයුතු දිරිගැන්වීමට උපකාරී නොවුණි. පැමිණිලි මධ්‍යස්ථානයේ පවතින සේවක පුරප්පාඩු ද එහි කටයුතු කෙරේ අයහපත් ලෙස බල පා තිබුණි. කාන්තා කමිටුව කොළඹ ප්‍රදේශයේ පමණක් පිහිටුවා තිබීම නිසා ජනතාවට එමගින් සේවය ලබා ගැනීමේ දී දුෂ්කරතාවන්ට ලක් වී ඇත.

කමිටුව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට කිසිදු විධිමත් වැඩ පිළිවෙළක් ආයතනය තුළ නොමැත. සේවක හිඟය මෙන්ම මූල්‍යමය අපහසුතා ද කාන්තා අයිතීන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙහෙයවීමේ දී බාධා වශයෙන් පවතී. කාන්තා අයිතීන් තහවුරු කිරීම පෙරදැරි කර ගනිමින් මාධ්‍ය වැඩමුළු පැවැත්වීම ද ප්‍රශස්ත මට්ටමක නොපවතින බව නිගමනය කළේය.

මේ සියලු කාරණා තුළින් අවසානයේ එළඹිය හැකි නිගමනය වන්නේ කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ජාතික කාන්තා කමිටුවේ දායකත්වය අවම මට්ටමක පවතින බවයි.

කමිටුව සතු [illegible] නොමැතිකම [illegible] කිරීම් [illegible] සැපිදීම හා [illegible] සමාජයේ ගුණගරුක බව හා [illegible] බව වැඩි

කිරීමට වැඩසටහන් මෙහෙයවීම ද, පවුල් සංස්ථාව තුළ ලිංග භේදය පදනම් කොටගෙන ක්‍රියාත්මක වන ප්‍රචණ්ඩත්වය මිනිස් අයිතිවාසිකම් කඩවීමක් බවට ජනතාව දැනුවත් කිරීමට වැඩසටහන් මෙහෙයවීම ද වැදගත් ය. සේවා නියුක්තිය සම්බන්ධව සියළු මට්ටම්වලදී සම අයිතිය හා සම අවස්ථා ලබා දීම පිළිබඳ රාජ්‍ය, පෞද්ගලික හා අනියම් අංශවල බලධාරීන් දැනුවත් කිරීමට කමිටුවට පියවර ගත හැක.

පැමිණිලි මධ්‍යස්ථානයේ මෙන්ම පැමිණිලි ඉදිරිපත් කරන අයගේ පහසුව පිණිස ජාතික කාන්තා කමිටු ආයතනය තුළ නීති ආධාර හා උපදේශන ඒකක පිහිටුවා සේවය ලබා දීම ද අවශ්‍ය වේ. යොමු කරනු ලබන පැමිණිලි සම්බන්ධව අදාල ක්‍රියාමාර්ග ගන්නා ලෙස ආයතන වෙත නියම කිරීමේ බලයක් කමිටුවට ලබාදීම වැදගත්ය. ඒ අතරම ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව ආයතනවලට සිහිකැඳවීම් යවා ප්‍රතිචාර ලබා ගැනීම මෙන්ම එම ආයතන යොමු කරන තොරතුරු පැමිණිලිකාරියට ද නැවත යොමු කිරීමේ වැඩපිළිවෙළ කමිටුවව විසින් ක්‍රමවත්ව පවත්වා ගෙන යාම අවශ්‍යය. එමෙන්ම ආදල පාර්ශවයන් දුෂ්කරතාවයන්ට පත්වීම වැළැක්වීම සඳහා ජාතික කාන්තා කමිටුව හා එම ආයතන අතර අන්තර් සබඳතාවයක් ගොඩනැඟීම අනිවාර්ය වේ. එමෙන්ම පැමිණිලි මධ්‍යස්ථානය ප්‍රාදේශීය වශයෙන් ස්ථාපිත කිරීම ද, වසර කිහිපයක සිටම පවතින නීති නිලධාරී පුරප්පාඩුව පිරවීමට මෙන්ම පළපුරුදු නිලධාරීන් ඒ සඳහා පත් කිරීම ද වැදගත් ය. කමිටුව සතු බලතල වැඩි කොට කාන්තා කොමිෂමක තත්ත්වයට එය පත් කිරීමට රජය විසින් කටයුතු කරන්නේ නම් අතිශය වැදගත් වනු ඇත.

කමිටුව පිළිබඳව ජනතාවට අදහසක් ලබා දීමට රූපවාහිනීය, ගුවන් විදුලිය, පුවත්පත් යන මාධ්‍යයන් භාවිතයට ගත හැක. කාන්තා ප්‍රඥප්තියේ සඳහන් අයිතිවාසිකම් හා ගැටෙන නීති හඳුනාගෙන ඒවා සංශෝධනය කිරීමට අදාල ප්‍රතිපත්ති සම්පාදකයින් හා ආයතන දැනුවත් කිරීම මඟින් ඔවුන් පෙළඹවීමට ඉතා දක්ෂ හා ක්‍රියාකාරී ලෙස කමිටුවේ දායකත්වය ලබාදීම වැදගත් ය. කෙසේ වුවද කාන්තා ප්‍රඥප්තියට නෛතික බලයක් ලබාදීමට රජයේ අවධානය යොමුවීම වැදගත් අතර, එමඟින් එහි දැක්වෙන විධිවිධාන නෛතිකව බලාත්මක කළ හැකිවන අතර, ජාතික කාන්තා කමිටුවට ද කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම විෂයෙහි විශාල දායකත්වයක් ලබාදීමට හැකිවනු ඇත.

ආශ්‍රිත ග්‍රන්ථ


1. Agosin, M. (2003) Women Gender & human Rights (A Global Perspective), New Delhi, Rawat Publication
2. ප්‍රනාන්දු, එල්. (1997) මානව අයිතිවාසිකම් යුතුකම් සහ ප්‍රජාතන්ත්‍රවාදය, කොළඹ 07, මානව අයිතිවාසිකම් අධ්‍යාපන මධ්‍යස්ථානය.
3. සැමුවෙල්, කේ. (1999) ස්ත්‍රී අයිතීන් විමසුම වාර්ෂික වාර්තාව, කොළඹ 05, කාන්තාව හා මාධ්‍ය සාමූහිකය.
4. සුමනසේකර, එස්. (2006), කාන්තාවන් දේශපාලනයට සහභාගී විය යුත්තේ ඇයි?, නාරාහේන්පිට, ජාතික කාන්තා කමිටුව.
5. අන්තර් ජාතික මානව අයිතිවාසිකම් පනත (2003) කොළඹ 07, එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය.
6. කතෘ (2006 සැප්.) "කාන්තාවන්ට එරෙහි හිංසනය - පොලිස් දත්ත", සුවදැරිකා සවිය - පුවත් සඟරාව, ජාතික කාන්තා කමිටුව, පළමු කලාපය, 2 කාණ්ඩය
7. පතිරණ,එන්. (2005 පෙබරවාරි). හෙට ලොවට නව දැක්මක්, ප්‍රගතියේ හවුල්කරුවෝ, ජාතික කාන්තා කමිටුව,3 කලාපය, 4 කාණ්ඩය
8. ප්‍රගතිය හා සැළසුම් (2000) කොළඹ 05, වනිතා කටයුතු අමාත්‍යාංශය.
9. වාර්ෂික වාර්තාව (2003) කොළඹ 05, වනිතා කටයුතු අමාත්‍යාංශය.